අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை,
General Certificate of Education (Adv. Level) Examination,

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடல் ஊடகக்கற்கை II
Communication and Media Studies II

පැය 03

❖ **ප්‍රශ්ණ පහක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

01.

i.මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ කුසලතා හතර කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. ප්‍රචණ්ඩතාව පුවත්පත් මාධ්‍යයෙහි නිරූපණයවන ආකාර දෙකක් කෙටියෙන් විමසන්න.

iii. මාධ්‍ය ප්‍රචණ්ඩත්වයට හසු නොවී සිටීමට ග්‍රාහකයා සතුවිය යුතු නිපුණතා තුනක් පැහැදිලි කරන්න.

iv.මාධ්‍ය විචාරය නිර්මාණකරුවාට වැදගත් වන ආකාරය කරුණු හතරක් ඇසුරින් පැහැදිලි කරන්න.

02.

i.සංස්කෘතිය පිළිබද බී. මැලිනොවුස්කිගේ නිර්වචනය ලියන්න.

ii.මාධ්‍ය සංස්කෘතිය හේතුවෙන් සමාජයේ ඇතිව පවතින වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න.

iii. සන්නිවේදනයේදී සන්නිවේදකයා , ග්‍රාහකයා හා පණිවිඩය ආදාරශීලී විය යුතු ආකාර දෙක බැගින් දක්වා පැහැදිලි කරන්න.

iv.ගෝලීයකරණ සංකල්පයේ දිගුවක් ලෙස පවතින නවලිබරල්වාදය ක්‍රියාත්මක වීම කරුණු හතරක් ඇසුරෙන් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

03.

i.මැක්ස් මුලර් පඩිවරයා දක්වන ලද භාෂාව බිහි වූ ආකාර හතර කෙටියෙන් පැහැදිලි කරන්න.

ii.මල භාෂාවක් හෙවත් අජීව භාෂාවක ලක්ෂණ දෙකක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.

iii.නව මාධ්‍යය භාෂාව පිළිබද කරුණු තුනක් දක්වා නිදසුන් සහිතව විමසන්න.

iv.වෙළද දැන්වීම්කරණයේ වාසි අවාසි දෙක බැගින් දක්වා නිදසුන් සහිතව පැහැදිලි කරන්න.



MEDIA
හදවතට විදින මීඩියා
සමීර හේරත්

04.

i.මනසේ ත්‍රිත්වාකාර ව්‍යුහය ඇද නම් කරන්න.

ii.ආයතනයක් තුළ ඇතිවන ගැටුම් කළමනාකරණය කළ හැකි  ආකාර තුනක් විමසන්න.

iii.සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමෝපායන් යොදා ගැනීමේ සුවිශේෂී වාසි පිළිබද විමල් දිසානායක මහතා දක්වන ලද කරුණු තුනක් පැහැදිලි කරන්න.

iv.සංවර්ධනය පිළිබද පවතින ආකල්පමය ගැටළු හතරක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

05.

i.වාරණය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ නිපුණතා දෙකක් කෙටියෙන් විමසන්න.

Iii.මහජන සම්බන්ධතා සැලැස්මක අඩංගු විය යුතු සාධක තුනක් දක්වා පැහැදිලි කරන්න.

iv.පුරවැසි මාධ්‍යකරණයේ ස්වභාවය කරුණු හතරක් ඇසුරින් නිදසුන් සහිතව විමර්ෂණය කරන්න.

06.

i.සන්නිවේදනය පිළිබද එඩ්වඩ්. ෂැපියර්ගේ නිර්වචනය ලියන්න

ii.අවිධිමත් හා විධිමත් යන සන්නිවේදන විධි ක්‍රම දෙක පිළිබද කෙටියෙන් විමසන්න.

iii.අන්තර් පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ තුනක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

iv.ෂැනොන් වීවර් ආකෘතිය ඇද කරුණු හතරක් ඇසුරින් ආකෘතිය විමසන්න.

07.

i.මහජන සම්බන්ධතාවය පිළිබද බ්‍රිතාන්‍යය මහජන සම්බන්ධතා ආයතනයේ නිර්වචනය ලියන්න.

ii.ආයතනයකට මහජන සම්බධතා කටයුතු වෙනුවෙන් භාවිතා කළ හැකි නව මාධ්‍ය දෙකක් පැහැදිලි කරන්න.

iii.මහජන සම්බන්ධතාවය සදහා ආයතනයක් තුළ ඡායාරූප භාවිතා කළ හැකි ආකාර තුනක් විමසන්න.

iv. විද්‍යුත් මාධ්‍යක් වන ගුවන්විදුලියේ ලක්ෂණ හතරක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.